# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,225 - 2021 අප්‍රේල් මස 23 වැනි සිකුරාදා - 2021.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 932 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 939 |


*සැ. යු.*-(i) ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2021 අප්‍රේල් මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මැයි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

929 B 82224 — 5,403 (2021/03)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම්, අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පහත අංක හා දිනයන් දරන *ගැසට් පත්‍රයේ* මා විසින් පළ කරන ලද උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයන්හි අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

උපලේඛනය

| *අනු අංකය* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ගැසට් අංකය* | *ගැසට් දිනය* |
|---|---|---|---|---|---|
| 01. | මඩකලපුව | මන්මුනේ උතුර | මඩකලපුව ශික්ෂණ රෝහල කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | 2114 | 2019.03.08 |
| 02. | යාපනය | යාපනය | යාපනය ශික්ෂණ රෝහල කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | 2114 | 2019.03.08 |
| 03. | අනුරාධපුරය | නැගෙනහිර නුවරගම් පළාත | අනුරාධපුරය ශික්ෂණ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2123 | 2019.05.10 |
| 04. | කුරුණෑගල | කුරුණෑගල | කුරුණෑගල මහරෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |
| 05. | කුරුණෑගල | කුලියාපිටිය, බටහිර | කුලියාපිටිය මූලික රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2147 | 2019.10.25 |
| 06. | පුත්තලම | හලාවත | හලාවත මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2140 | 2019.09.06 |
| 07. | පුත්තලම | පුත්තලම | පුත්තලම මූලික රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2140 | 2019.09.06 |
| 08. | කළුතර | කළුතර | කළුතර මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |
| 09. | කළුතර | හොරණ | හොරණ මූලික රෝහල | 2137 | 2019.08.16 |
| 10. | කළුතර | පානදුර | කේතුමතී රෝහල | 2137 | 2019.08.16 |
| 11. | කොළඹ | සීතාවක | අවිස්සාවේල්ල මූලික රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |
| 12. | කොළඹ | තිඹිරිගස්යාය | ජාතික රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |
| 13. | කොළඹ | තිඹිරිගස්යාය | කාසල් රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |
| 14. | කොළඹ | තිඹිරිගස්යාය | නයින් වෙල්ස් රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ගැසට් අංකය | ගැසට් දිනය |
|---|---|---|---|---|---|
| 15. | කොළඹ | තිඹිරිගස්යාය | ද සොයිසා රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 16. | කොළඹ | දෙහිවල | කළුබෝවිල ශික්ෂණ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 17. | කොළඹ | මහරගම | මහරගම අපේක්ෂා රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 18. | ගම්පහ | ගම්පහ | ගම්පහ මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 19. | ගම්පහ | ජා.ඇල | රාගම ශික්ෂණ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 20. | රත්නපුර | රත්නපුර | රත්නපුර මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 21. | රත්නපුර | ඇඹිලිපිටිය | ඇඹිලිපිටිය මහ රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 22. | රත්නපුර | ඉඹුල්පේ | බලංගොඩ මූලික රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 23. | මොණරාගල | මොණරාගල | මොණරාගල මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 24. | බදුල්ල | බදුල්ල | බදුල්ල මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 25. | කෑගල්ල | කෑගල්ල | කෑගල්ල මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 26. | ගාල්ල | ගාල්ල කඩවත් සතර | මහමෝදර ශික්ෂණ රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 27. | ගාල්ල | ඇල්පිටිය | ඇල්පිටිය මූලික රෝහල කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 28. | ගාල්ල | බලපිටිය | බලපිටිය මූලික රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 29. | ගාල්ල | ගාල්ල කඩවත් සතර | කරාපිටිය ශික්ෂණ රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 30. | මාතර | මාතර | මාතර මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 31. | හම්බන්තොට | හම්බන්තොට | හම්බන්තොට මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |
| 32. | මහනුවර | කඩවත් සතර හා ගඟවට කෝරළය | පේරාදෙණිය ශික්ෂණ රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | 2114 | 2019.03.08 |

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ගැසට් අංකය | ගැසට් දිනය |
|---|---|---|---|---|---|
| 33. | මහනුවර | කඩවත් සතර හා ගඟවට කෝරළය | මහනුවර ශික්ෂණ රෝහල II කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |
| 34. | මාතලේ | මාතලේ | මාතලේ මහ රෝහල් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |
| 35. | නුවරඑළිය | නුවරඑළිය | නුවරඑළිය මහ රෝහල් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | 2114 | 2019.03.08 |

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 අප්‍රේල් මස 01 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

04-758

---

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරු නාමය - නීති සහකාර
සේවා ගණය - ආශ්‍රිත නිලධාරි
පුරප්පාඩු ගණන - 02

02. *අධ්‍යාපන සුදුසුකම් :*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

03. *වැටුප :*
i. වැටුප් කේත අංකය : MN 4-2016 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව)
ii. වැටුප් පරිමාණය : රු. 31,490 - 10x445 - 11x660-10x730-5x750-රු. 54,250
iii. වැටුපට අමතරව රජය අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

04. *වයස :*
අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

05. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

06. *වෙනත් සුදුසුකම් :*
i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් 2021. 05. 21 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 08 යටතේ සඳහන් ලකුණු පටිපාටියට අනුකූලව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම්* | 20 | අදාළ නොවේ. |
| අතිරේක වෘත්තීය සුදුසුකම්* | 15 | |
| පළපුරුද්ද* | 30 | |
| භාෂා හැකියාව* | 15 | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

*සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතුය.

09. *පත්වීමේ ස්වභාවය :*

1. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.
11. තෝරාගත් අපේක්ෂකයින් පත්වීමේ දින සිට තුන් අවුරුදු (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ.
111. පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිනු ඇත.
1v. පත්වීම් ලාභීන් විසින් රජය විසින් පත්වීමට අදළව නියම කරනු ලබන අනෙකුත් අවශ්‍යතාවයන් නිසි පරිදි සම්පූර්ණ කර ගැනීම සිදුකළ යුතුය.

10. *අයදුම් කිරීමේ ක්‍රමය :*

I. *ආදර්ශ අයදුම් පත -*
මෙම නිවේදනය අවසානයේ පලකර ඇත. අයදුම්කරුවන් විසින් ආදර්ශ අයදුම්පත තමා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම පිළියෙල කළයුතු අතර, එය තමාගේම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. අයදුම් පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු අතර , තමන් වෙනුවෙන් අදළ නොවන වගන්ති වෙතොත් ඒවා ''අදළ නොවේ'' යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබාගත යුතුය. (ආදර්ශ අයදුම්පතේ අංක 01 සිට අංක 06 දක්වා පළමු පිටුවේද අංක 07 සිට අංක 09 දක්වා දෙවන පිටුවේද අංක 10 සිට අංක 11 දන්වා තෙවන පිටුවේද වනසේ A4 ප්‍රමාණයේ කඩදසිවල සකස් කරන්න.) ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රමාණවත් වනු ඇත.

II. *අයදුම්පත් යොමුකළ යුතු ආකාරය සහ අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය -*
අයදුම්පත් 2021 මැයි මස 21 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නව මහ ලේකම් කාර්යාලය,මාළිගාවත්ත, කොළඹ- 10. යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නීති සහකාර තනතුරට බඳවා ගැනීම'' ලෙස පැහැදිළිව සඳහන් කළ යුතුය.

III. *දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අයදුම්පත් -*
දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

IV. *අයදුම්පත් සහතික කිරීම -*
දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්වයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥයෙකු / නොතාරිස් කෙනෙකු/ රජයේ පාසලක විදුහල්පතිවරයෙකු /නාවික /ගුවන් /යුධ හමුදවක

කොමිෂන් ලත් නිලධාරියෙකු /රජයේ ස්ථිර සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු/ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළනිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතුය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම -*
අයදුම්කරුවන් තම අයදුම්පතේ සඳහන් කර ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ කවර අවස්ථාවකදී වුවද අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහු /ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

12. මෙම නිවේදනයේ සඳහන් නොකරන ලද අදාළ වන්නා වූ වෙනයම් කරුණක් වේනම් එය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්.

2021 අප්‍රේල් මස 23 වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ-10.

ආදර්ශ අයදුම්පත්‍රය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය ඉදිරියේ ✓ ලකුණ යොදන්න. (පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නීති සහකාර තනතුරට බඳවා ගැනීම - 2021

01. අයදුම්කරුගේ නම :
    1.1 මුලකුරු අගට යෙදූ මුලකුරු සමග නම :————.
    (ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා : SILVA A. B.)
    1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
    (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
    1.3 මුලකුරු අගට යෙදූ මුලකුරු සමග නම :————.
    (සිංහලෙන්/දෙමළෙන්)
    1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
    (සිංහලෙන්/දෙමළෙන්)

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

(අදාළ කොටුව තුළ/ ✓ ලකුණ යොදන්න)

04. විවාහක/අවිවාහක භාවය :

විවාහක ☐ අවිවාහක ☐
(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

05. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු ද යන්න ඔව් ☐ නැත ☐
(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

07. (i) ස්ථිර ලිපිනය :..............................................................................
..............................................................................................
(ලිපිනය වෙනස් වුවහොත් ඒ ගැන වහාම දැන්විය යුතුය.)

(ii) පෞද්ගලික ලිපිනය :..............................................................................
..............................................................................................

08. ඊ මේල් ලිපිනය :————.

09. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

10. අධ්‍යාපන සුදුසුකම් :
10.1 අ.පො.ස. (සා පෙළ) විභාගය පිළිබඳ විස්තර :
වර්ෂය හා මාසය :————. විභාග අංකය :————.
මාධ්‍ය :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

(ලබාගෙන ඇති ඉහළම සුදුසුකම් සඳහන් කරන්න.)

10.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
වර්ෂය හා මාසය :————. විභාග අංකය :————.
මාධ්‍ය :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

(ලබාගෙන ඇති ඉහළම සුදුසුකම් සඳහන් කරන්න.)

10.3 නීති ක්ෂේත්‍රයේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

| *විභාගය/උපාධිය* | *ක්‍රියාත්මක වන දිනය* | *විශ්වවිද්‍යාලය/ආයතනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

10.4 වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

| *සුදුසුකම* | *ක්‍රියාත්මක වන දිනය* | *ලබාගත් ආයතනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

11. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකර තිබේද? :————.
(එසේ නම් විස්තර දක්වන්න.)

12. ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වේනම්) දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේද? :————.

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියෙන් වරදකරු වී තිබේද? (ඔව් නම් විස්තර දක්වන්න)

..........................................................................................................

..........................................................................................................

14. ඔබ පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න. :

1. නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දුරකථන අංකය :————.

2. නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දුරකථන අංකය :————.

15. අයදුම්කරුගේ සහතිකය :
මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය වූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා සියලු අයිතිවාසිකම් රහිතව තනතුරෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................. (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය යන මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය 2021 ............ මස ............ දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න.)
දිනය :————.

අයදුම්කරු රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත නම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන .................. මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය (අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/රාජ්‍ය සංස්ථාවේ .........) සේවයේ නියුක්ත බවත්, ඔහුට/ඇයට එරෙහිව විනය පරීක්ෂණ කිසිවක් නොමැති බවත්, ..................දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි. තවද ඔහු/ඇය නීති සහකාර තනතුරට පත් කිරීම සඳහා තෝරාගතහොත් මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ...............) සේවයෙන් මුදා හැරිය හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
රාජකාරි ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න.)
දිනය :————.

04-788

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය- 2019 (2020)

අංක 2186 දරන 2020 ජූලි මස 24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ''ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2019 (2020)'' විභාග නිවේදනයේ, 6.0 සුදුසුකම් ඡේදයේ (ඇ) කොටස සහ (ඈ) හි (i) කොටස පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

6.0 *සුදුසුකම් :*

(ඇ) **2020.08.24 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2002.08.24 දිනට හෝ ඊට පෙර හා 1975.08.24 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)**

(ඈ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

02. ඉහත සංශෝධන මෙම විභාග අවස්ථාවට පමණක් අදාළ වන බව සැලකිය යුතු ය. එසේම අයදුම්කරුවන් තනතුරට අදාළ සියලු සුදුසුකම් 2020.08.24 දින වන විට සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධි විධාන එලෙසින්ම බල පැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2021.05 13 තෙක් දීර්ඝ කරනු ලැබේ. මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධන හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2021 අප්‍රේල් මස 09 වැනි දින
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

04-755

---

## රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019 (2020)

අංක 2186 දරන 2020 ජූලි මස 24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ''ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය -2019 (2020)'' විභාග නිවේදනයේ, 6.0 සුදුසුකම් ඡේදයේ සටහනට අදාළව පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

6.0 *සුදුසුකම්* :

**සටහන :**

6. රජයේ සේවයේ (පළාත් රාජ්‍ය සේවාවන්ගේ නොවන) දෙපාර්තමේන්තුගත ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) සේවා ගණයේ, සක්‍රීයව හා අඛණ්ඩව පුස්තකාල හා සම්බන්ධව රාජකාරි කටයුතුවල නිරත බවට ආයතන ප්‍රධානියා විසින් විධිමත්ව තහවුරු කරනු ලබන,

(i) ඉහත 6.1 සහ 6.2 ප්‍රකාරව සුදුසුකම් සම්පූර්ණ කර ඇති තනතුරේ ස්ථිර කරන ලද වසර 10ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරින්ට

සහ

( ii) ඉහත 6.1 හා 6.2 හි (අ) සහ (ආ) හි සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් හෝ සම්පූර්ණ කර ඩිප්ලෝමා සහතිකය ලබා ඇති, තනතුරේ ස්ථිර කරන ලද වසර 05ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට ද මේ වතාවට පමණක් විභාගය සඳහා පෙනී සිටිය හැක.

02. අයදුම්කරුවන් තනතුරට අදාළ සියලු සුදුසුකම් 2020.08.24 දින වනවිට සම්පූර්ණ කර තිබිය යුතුය.

03. එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධි විධාන එලෙසින්ම බල පැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2021.05.13 තෙක් දීර්ඝ කරනු ලැබේ. මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධන හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2021 අප්‍රේල් මස 09 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

04-756

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

## ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

## කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව

*පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2021 ජූලි*

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි (IETI) පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා තරුණ තරුණියන්ගෙන් ඉල්ලුම්පත් කඳවනු ලැබේ.

1. *පවත්වනු ලබන පාඨමාලා* :

<table>
<tr><th></th><th>පාඨමාලා විස්තර</th><th>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)</th><th>කාලය</th></tr>
<tr><td colspan="4">01, 02, 03 , 04 , වෘත්තීන් සඳහා අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 6 ක් සමත් වී තිබීම හෝ අ. පො. ස. (උ. පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 2න් එක් විෂයයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ. පො. ස. (සා. පෙළ) සිංහල භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 ක් සමත් වී තිබීම.</td></tr>
<tr><td>01.</td><td>ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) - Electronic Craftsman (Special)<br>(Basic Work Shop practice, Domestic Electrical Installation, Analog & Digital Electronic, Industrial Electronic, PLC, Micro Controller, (PIC & ARDUINO) & Project Works</td><td>-</td><td>අවු. 03</td></tr>
<tr><td>02.</td><td>විදුලි කාර්මික ශිල්පී (විශේෂ) - Electrician (Special)<br>ගෘහස්ථ හා කර්මාන්තශාලා විදුලි පරිපථ, විදුලි මිනුම් උපකරණ, ගෘහස්ථ/ කර්මාන්තශාලා ආරක්ෂක හා සන්නිවේදන පද්ධති වායු පාලන තාක්ෂණය, PLC තාක්ෂණය, ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස්, ඔටෝමේෂන් පද්ධති</td><td>4 වන මට්ටම</td><td>අවු. 03</td></tr>
<tr><td>03.</td><td>ඉදිකිරීම් සුපරීක්ෂක - Construction Supervisor<br>(Construction Management, Surveying & Leveling, Road Construction, Auto Cad, Quantity Surveying , Building Drawing & Estimate) ක්ෂේත්‍රයේ දැවැන්ත සමාගම් සමග වැඩබිම් පුහුණුව</td><td>4 වන මට්ටම</td><td>අවු. 01 1/2</td></tr>
<tr><td>04.</td><td>ප්‍රමාණ සමීක්ෂණ සහකාර - Quantity Surveying Assistant)<br>( Preparation of BOQ for small and medium construction, Pricing of BOQ, Pre-pare Bidding Document)</td><td>4 වන මට්ටම</td><td>අවු. 01</td></tr>
<tr><td colspan="4">05, 06, වෘත්තීන් සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත්වීම.</td></tr>
<tr><td>05.</td><td>ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී - Refrigeration & Air Conditioning Mechanic<br>සියලුම වර්ගයේ ශීතකරණ, ගෘහස්ථ හා කර්මාන්තශාලා වායු සමන පද්ධති</td><td>4 වන මට්ටම</td><td>අවු. 02</td></tr>
<tr><td>06.</td><td>යන්ත්‍ර කාර්මික ශිල්පී (විශේෂ) - Machinist (Special)<br>CNC Programming, CNC Machining, EDM Process, Wire Cutting Process Laser Cutting, Solid works , Auto Cad</td><td>4 වන මට්ටම</td><td>අවු. 03</td></tr>
<tr><td colspan="4">07 , 08 වෘත්තීන් සඳහා අ .පො .ස. (සා .පෙළ ) විභාගයේ දී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.</td></tr>
<tr><td>07.</td><td>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - Information & Communication Technology Technician<br>(Maintain files & folders, Ms Word, Ms Excel , Ms Power point, Maintain Database ( Ms Access) , Internet & E- mail, Install &Configure operating system, Installation & trobleshooting of Network, Graphic for Web, Design static web pages, Develop Basic Software Solution)</td><td>4 වන මට්ටම</td><td>අවු. 01</td></tr>
</table>

| | *පාඨමාලා විස්තර* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* |
|---|---|---|---|
| 08. | **පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී** - Computer Graphic Designer<br>(Adobe Photoshop, Adobe Illustrator, Adobe InDesign, Coral Draw, Printing & Scanning Method) | 4 වන මට්ටම | අවු. 01 |
| 09 , 10 , වෘත්තීන් සඳහා අවම වශයෙන් අ .පො. ස. (සා .පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම. | | | |
| 09. | **පෑස්සුම් ශිල්පී (විශේෂ)** - Welder (Special )<br>(MMA/ GAS/TIG/MIG/ MAG/FCAW /PLASMA/SPOT/STUD Welding ශිල්පීය ක්‍රම, Destructive & Non Destructive Testing Methods, Plate & Pipe weld) | 4 වන මට්ටම | අවු. 03 |
| 10. | **පොත් බඳින්නා** - Book Binder<br>මුද්‍රණ කර්මාන්තය හඳුන්වා දීම, පොත් බැඳීම සහ අවසන් කිරීම, පොත් බැඳීමේ අවසාන කිරීමේ කොටස් හැඩගැස්වීම, මුද්‍රණයට සූදානම් වීම/ හිස් කඩදාසි සුරක්ෂිත කිරීම, Finishing කොළ සූදානම් කිරීම, එකතුකරගත් කොටස් සුරක්ෂිත කිරීම, පොත් කවරය සූදානම් කිරීම, Finishing කිරීම, Spring back පොත් බැඳීම Rebinding කිරීම | 4 වන මට්ටම | අවු .01 1/2- |
| 11 ,12, වෘත්තීන් සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබීම. | | | |
| 11. | **ජලනල කාර්මික ශිල්පී** - Plumber<br>දැනට කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතාවන PVC, CPVC,GI, PB, PPR හා HDPE නල වර්ග But fusion, Heat fusion, හා Electro fusion වැනි අති නවීන තාක්ෂණික ක්‍රමෝපාය භාවිතා කරමින් සම්බන්ධ කිරීම, නවීන සනීපාරක්ෂක උපාංග ස්ථාපනය, ජල පොම්ප ස්ථාපනය, උණුසුම් ජලනල පද්ධති ස්ථාපනය සහ සැලසුම් නිර්මාණය හඳුනා ගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම | 4 වන මට්ටම | අවු .02 |
| 12. | **දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ)** - Carpenter (Furniture)<br>දැව සහ සංයුක්ත දැව භාවිතය, දැව මූට්ටු වර්ග, න්‍යායික දැනුම, සැලසුම් නිර්මාණය, ඇස්තමේන්තුව, නවීන යන්ත්‍ර ආරක්ෂිතව පරිහරණය, යන්ත්‍ර තල මුවහත්ව තැබීම හා නඩත්තුව, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා නිමහම් කිරීම. | 4 වන මට්ටම | අවු .02 |

02. *වයස* : 2021.05.21 වැනි දිනට වයස අවුරුදු 16 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුය.

03. *පුහුණුව පිළිබඳ විස්තර* :

3.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැලසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේදී මූලික පුහුණුව ආයතනය තුළදී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේදී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් බහුලව ඇත.

04. *තෝරා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

05. ප්‍රතිලාභ :

5.1 තෝරාගත් වෘත්තීන් සඳහා නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ රු. 4,000 ක මාසික දීමනාව
5.2 දුර අනුව නේවාසිකාගාර පහසුකම් (පිරිමි ළමුන්ට පමණයි)
5.3 සහන මිලට ශ්‍රී ලංගම වාර ප්‍රවේශපත්‍ර
5.4 පුස්තකාල පහසුකම්
5.5 සහන මිලට ආහාරපාන
5.6 නොමිලේ නිල ඇඳුම්

06. *අයදුම්පත් එවිය යුතු ආකාරය* :

6.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත් හෝ www. naita. gov. lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සමග 2021/05/21 දිනට පෙර **අධ්‍යක්ෂ / විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ **"ආධුනිකයින් බඳවා ගැනීම 2021 ජූලි"** යන්න සඳහන් කළයුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමග එවිය යුතුය.

6.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

6.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරණ අයට මේ සඳහා අයදුම් කළ නොහැක.

6.4 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කළ යුතුය.

තරංග නලීන් ගම්ලත්,
සභාපති.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
අංක 581, ගාලු පාර, කටුබැද්ද,
මොරටුව.

ආදර්ශ අයදුම් පත්‍රය ( 11 1/2 x 8 1/4" (A4) ප්‍රමාණයේ)

*ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය*

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

*ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2021 ජූලි*

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :.................................................................................මයා/මිය/ මෙනෙවිය

02. මුලකුරු සමග නම :.................................................................................

03. ලිපිනය :.................................................................................

04. පදිංචිය (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ................................................
(ii) දිස්ත්‍රික්කය : ................................................

05. දුරකථන අංකය : නිවස : .......................................... ජංගම : ..............................................

06. උපන් දිනය :............................................

07. ජාතික හැඳුනුම්පත් අංකය :............................................

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම X ලකුණින් සළකුණු කරන්න)

| අ. පො. ස. (උ. පෙළ) | | අ. පො. ස. (සා. පෙළ) | | 8 වන ශ්‍රේණිය | |
|---|---|---|---|---|---|

අ .පො .ස .(සා. පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො.ස . (උ. පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| | |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

04- 710

---

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

### සමාජ වැඩ පිළිබඳ දැවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලාව

### සිංහල මාධ්‍යය/දෙමළ මාධ්‍යය - 2020/2021

සමාජ වැඩ පිළිබඳ දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ සමාජ සේවා, සමාජ සුභසාධන හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, කුසලතා හා ආකල්පවලින් පිරිපුන් සමාජ වැඩ වෘත්තිකයින් බිහි කිරීමයි.

01. *ඇතුළත්වීමේ සුදුසුකම් :*

(i) අ.පො.ස. (උසස් පෙළ) සමත්වීම (විෂයයන් 03 සඳහා සාමාර්ථ ලබාගැනීම); හෝ

(ii) (අ) රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරක හෝ වැඩි ගණනක අවුරුදු 03කට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම

(i) සමාජ සේවා දෙපාර්තමේන්තුව හා පළාත් සභාවල සමාජ සේවා නිලධාරි;
(ii) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි, සහතික කල පාසල්වල පාසල්පති, නිවාසාචාර්ය හා උපනිවාසාචාර්ය, ළමාරක්ෂක නිලධාරි;
(iii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජේලර් හා සුභසාධන නිලධාරි;
(iv) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ග්‍රාම නිලධාරි;
(v) ජාතික තරුණ සේවා නිලධාරි (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) හා සහකාර තරුණ සේවා නිලධාරි;
(vi) කර්මාන්ත හා වැවිලි ක්ෂේත්‍රයේ රාජ්‍ය නීතිගත සංස්ථා, මණ්ඩල, පෞද්ගලික අංශයේ ප්‍රජා සංවර්ධන නිලධාරි, සුභසාධන නිලධාරි;
(vii) සමෘද්ධි සංවර්ධන නිලධාරි, කෘෂි නිෂ්පාදන හා පර්යේෂණ සහකාර;
(viii) මුල් ළමාවිය සංවර්ධන නිලධාරි;
(ix) කාන්තා සංවර්ධන නිලධාරි;
(x) සංවර්ධන සහකාර (සමාජ සේවා දෙපාර්තමේන්තුව);
(xi) උපදේශන නිලධාරි;
(xii) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි;
(xiii) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි;
(xiv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා පළාත් සභාවල ගුරුවරුන්;
(xv) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ධීවර සමාජ සංවර්ධන සහකාර;
(xvi) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක, මහජන සෞඛ්‍ය හෙද/හෙදි නිලධාරීන්, මනෝ වෛද්‍ය සමාජ සේවක;
(xvii) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන කොමිෂන් සභාවේ ප්‍රජා මණ්ඩල නිලධාරි, පළාත් පාලන නිලධාරි, සහන නිලධාරි;
(xviii) රජයේ හෝ රජයේ නොවන හෝ පෞද්ගලික අංශයේ ආයතනවල හෝ සමාන තනතුරු දරන නිලධාරීන්;
(xix) මානසික සෞඛ්‍ය සංවර්ධන සහකාර නිලධාරි (සෞඛ්‍ය අමාත්‍යාංශය);
(xx) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යාපන සභාවේ අනුමැතියට යටත්ව ඉහත සඳහන් සුදුසුකම් හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

*සටහන :*

(i) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් හෝ සමාජ සුභසාධන/සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් තිබෙන අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

02. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 20ට නොඅඩු සහ අවුරුදු 46ට නොවැඩි විය යුතුය.

03. *වෙනත් කොන්දේසි :*

(i) රැකියාවල නියුතු හෝ දැනටමත් වෙනත් පාඨමාලා හදාරන අය දෙවර්ෂ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට බැඳීමට අදහස් කරන්නේ නම්, වර්ෂ දෙකක කාලයක් සඳහා නිවාඩු ලබාගැනීම අත්‍යාවශ්‍ය වන අතර, නිවාඩු ලබාගැනීමේ සම්පූර්ණ වගකීම අයදුම්කරු සතු වේ. පාඨමාලාවේ ලියාපදිංචියට පෙර අධ්‍යයන නිවාඩු ලබාගත යුතුය.

(ii) පාඨමාලාවේ කාලසීමාව තුළ දී වෙනත් පූර්ණකාලීන පාඨමාලාවක් හැදෑරීමට අවසර නොමැති අතර, වෙනත් පාඨමාලාවක් හදාරන බව හෙළිවුවහොත් මෙම පාඨමාලාවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

04. ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියට පමුණුවනු ලැබේ. අවසාන තීරණය ගනු ලබන්නේ ආයතනයේ බඳවාගැනීමේ මණ්ඩලය විසිනි.

05. *පාඨමාලාව පැවැත්වෙන මාධ්‍යය .-* සිංහල/දෙමළ

06. *අයදුම්පත් .-* මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2021.05.17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරි, ජාතික සමාජ සංවර්ධන ආයතනය, ලියනගේමුල්ල, සීදුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර පැමිණ ද ලබාගත හැකිය. දැනට රැකියාවල නියුක්ත

අයදුම්කරුවන් අයදුම්පත් එවිය යුත්තේ තම සේව්‍යයාගේ මාර්ගයෙනි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය ඉක්මවා ලැබෙන සියලුම අයදුම්පත් ද, නියමිත සුදුසුකම් සපුරා නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ෂාමිණි අත්තනායක,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ජාතික සමාජ සංවර්ධන ආයතනය

2021 අප්‍රේල් මස 16 වැනි දින,
ලියනගේමුල්ල,
සීදුව,
ජාතික සමාජ සංවර්ධන ආයතනයේදී ය.

ආදර්ශ අයදුම්පත

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

සමාජ වැඩ පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව

**සිංහල මාධ්‍යය/දෙමළ මාධ්‍යය - 2020/2021**

| | |
|---|---|
| | |
| | |
| | |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. මුලකුරු සමග නම :
    (i) සිංහලෙන් :————.
    (ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

04. විවාහක/අවිවාහක බව :————.

05. උපන් දිනය :
    2021.05.17 වැනි දිනට වයස : අවුරුදු :————.මාස :————. දින :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. ලිපිනය (පෞද්ගලික) :
    (i) සිංහලෙන් :————.
    (ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

    ලිපිනය (රාජකාරි)
    (i) සිංහලෙන් :————.
    (ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
    දුරකථන අංකය :————.

08. පදිංචි දිස්ත්‍රික්කය :————.

09. පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

10. පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන මාධ්‍යය :
(සිංහල/දෙමළ) :————.

11. අධ්‍යාපන සුදුසුකම් :

| සමත් වූ විභාගය | විෂයයන් | සාමාර්ථය | විභාගයට පෙනීසිටි වර්ෂය සහ විභාග අංකය | මාධ්‍යය | විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| 01. අ.පො.ස. (සා.පෙළ)/ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර | 01.<br>02.<br>03.<br>04.<br>05.<br>06.<br>07.<br>08. | | | | |
| 02. අ.පො.ස. (උ/පෙළ) | 01.<br>02.<br>03.<br>04. | | | | |

| විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට අවම සුදුසුකම් ලබා තිබුණේද? ඔව්/නැත | | | |
|---|---|---|---|
| 03. උපාධිය : | | | |
| විෂයයන් | සාමාර්ථය | වර්ෂය හා මාධ්‍යය | විශ්වවිද්‍යාලය |
| 01.<br>02.<br>03.<br>04. | | | |

12. වෙනත් අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) ......................................................................................

(ii) ......................................................................................

(iii) ......................................................................................

13. දැනට නියුතු රැකියාව හා කලින් නියුක්තව සිටි රැකියා :

| දෙපාර්තමේන්තුව/ආයතනය | තනතුර | කාලසීමාව | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| 01.<br>02.<br>03.<br>04. | | | |

14. වෙනත් සුදුසුකම් :
(සමාජ සුභසාධනය පිළිබඳ ලබා ඇති පළපුරුද්ද, සමාජ සේවා සංවිධානවල දරා ඇති නිලතල, විශේෂ දක්ෂතා හා රුචිකත්වයන් පිළිබඳ සඳහන් කරන්න. (අවශ්‍ය නම් වෙනත් පත් ඉරුවක් අමුණන්න).

15. දැනට වෙනත් පාඨමාලාවන් කිසිවක් හදාරන්නේ නම් විස්තර දක්වන්න.

......................................................................................

16. මෙම පාඨමාලාව තෝරාගැනීමට හේතු :
මා විසින් ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බව සහතික කරමි. තෝරාගැනීමෙන් අනතුරුව ඉන් කිසිවක් අසත්‍ය බව පෙනී ගියහොත් පාඨමාලාවෙන් මා නෙරපා හරිනු ලැබීමට යටත්වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

..........................හිමි/මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. අයදුම්කරුගේ ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි ය. ඔහු/ඇය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා වැටුප් සහිත/රහිත නිවාඩු පිට මුදා හැරිය හැකිය.

————,
දෙපාර්තමේන්තුවේ/
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
නිල මුද්‍රාව :————.

04-754

---

**ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**
**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරි III ශ්‍රේණියේ තනතුර (MN 03-2016) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

1.0 ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරි තනතුර සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් 2021.05.23 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව - 40

2.0 මෙම විභාගය 2021 ජූලි මස දී පැවැත්වීමට අපේක්ෂිතය. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු 40 සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

අධ්‍යාපන සුදුසුකම් :

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිතය විෂය ධාරාවෙන් ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව ඇතුළුව විෂයන් 03 ක් එකවර සමත්වීම;

සහ

(ii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වෘත්තීය සුදුසුකම් :

(i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (සිවිල්),
හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්);

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්);

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම (සිවිල්),

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 06) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (සිවිල් අංශයෙන්)

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව, ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම (සිවිල් අංශයෙන්);

4.0 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.0 වෙනත් සුදුසුකම් :
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය,
(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(iv) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

6.0 වයස :
අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2003.05.23 දින හෝ ඊට පෙර හා 1991.05.23 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

7.0 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගය

7.1 විභාගය පැවැත්වීමට නියමිත ස්ථානය හා දිනය - කොළඹ නගරය - 2021 ජූලි මාසය

7.2 විභාගය පැවැත්වීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයන් ලෙස සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් එකක් තෝරා ගත යුතු අතර අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය පැය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| (1) බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයින්ගේ සිතීමේ, තර්කානුකූල භාවයත්, ඔවුන්ගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ. | 01 | 100 | 40% |
| (2) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ගොඩනැගිලි ඉදිකිරීම් මූලධර්ම, ඉදිකිරීම් කාර්යය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග, ජලනල එළීම හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙළ අපේක්ෂකයා විසින් අත්පත්කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. | 03 | 100 | 40% |

ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

8.1 *වැටුප් පරිමාණය :*

- රුපියල් 31,040-445 x 10 - 660 x 11 - 730 x 10 - 750 x 10 - රු. 57,550
- වැටුප් ක්‍රමය MN - 3 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව)

9.1 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

- බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
- පත් කරනු ලබන තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දක්වා තිබුණ ද අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය අනුව නිර්ණය කරනු ලැබේ.

10.0 මෙම නිවේදනයේ නියමයන්ට අනුකූලව තමන් විසින් සකස් කර ගන්නා ලද අයදුම්පතක් ඉදිරිපත් කළයුතු වේ. මෙම නිවේදනයට අනුකූල නොවන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.0 අයදුම්පතක් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

12.0

12.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුපත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

12.2 මෙම නිවේදනයේ 07 ඡේදය අනුව එක් එක් විෂයට ලකුණු 40% කට නොඅඩුව ලැබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනය ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ www.results.exam. gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම මගින් ප්‍රතිඵල දන්වනු ඇත.

13.0 *අයදුම් කළ යුතු ක්‍රමය :*

13.1 ආදර්ශ අයදුම්පත්‍ර විභාග නිවේදනයට අමුණා ඇති අයදුම්පත් ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් සැකසිය යුතු අතර අයදුම්පතේ පළමු පිටුව සඳහා අංක 01-06 තෙක්, අංක 07-2 වන පිටුවට හා අංක 08-11 තෙක් 3 වන පිටුවටත් ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කළ යුතු වේ. එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතු වේ. මෙම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එම විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට ඇත් ද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතු වේ.

13.2 අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරි III ශ්‍රේණියේ තනතුර (MN03-2016) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021" යනුවෙන් සඳහන් කර 2021.05.23 දිනට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

13.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.05.23 වේ.

13.4 විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.

13.5 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13.6 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13.7 අපේක්ෂකයෙකුට තමාට නියම කර ඇති ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයෙකුම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14.0 අත්සන සහතික කිරීම :

"අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරියලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන හෝ අයකු හෝ ලවා සහතික කර ගත යුතුය.

**සැලකිය යුතුයි :**

- අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවරැදි බව පිළිබඳව සහතික විය යුතුය.
- ඉහත පරිදි බඳවා ගන්නා සියලුම දෙනා රජයේ සේවකයින්ට අදාළ වන සියලුම නීතිරීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝග යන්ට ද යටත් වනු ඇත.
- විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වේ.
- තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම පොදු චක්‍රලේඛයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තීරණය අවසාන තීරණය වනු ඇත. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්. එම්. ජයතිලක හේරත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2021 අප්‍රේල් මස 23 වැනි දින,
අංක 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ,
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ දී ය.

**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරී III ශ්‍රේණියේ තනතුර (MN03 2016) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

**Open Competitive Examination for the Recruitment to the Post of Technical Officer Grade III (MN03-2016) in Department of National Community Water Supply -2021**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01.
1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02.
2.1 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ලිපිනය (පෞද්ගලික) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.3 ලිපිනය (පෞද්ගලික) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
(රජයේ සේවය පළාත් රාජ්‍ය සේවයේ සංස්ථාවක නියුක්ත නිලධාරියෙකු ඔහුගේ රාජකාරී ලිපිනය යෙදිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වේනම් එය වහාම දැන්විය යුතුය.)

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. දුරකථන අංකය 5.1 ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

5.2 ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

06.
6.1 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

07. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය:————. විභාග අංකය:————.

| අංකය | විෂය | සාමාර්ථ්‍යය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

| අංකය | විෂය | සාමාර්ථ්‍යය |
|---|---|---|
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| අංකය | විෂය | සාමාර්ථ්‍යය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

(ඇ) වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ඈ) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද :

.................................................................................................................
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

09. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇතොත්, විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන. ..................මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් හා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාව සනාථ කරන්න)

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ඃ (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

11.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය, සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත. කිසිදු විනය දඬුවමකට ලක්වී නැත/ඇත.

11.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදාහැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

දිනය :————.

04-709

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.